# ලංසු කැඳවීමයි

## රාගම උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ ආපනශාලා සේවය පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම 2021/2022 වර්ෂය

උතුරු කොළඹ ශික්ෂණ රෝහලෙහි 2021/2022 වර්ෂයට ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා පළපුරුදු සහ සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් මෙම රෝහලේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මිල ගණන් කැඳවනු ලැබේ. මේ සඳහා

i. ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

ii. ආපනශාලා පවත්වාගෙන යාම පිළිබඳව අවම වශයෙන් ආසන්න වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය.

02. මෙම කොන්ත්‍රාත්තුවක් සඳහා ආපසු නොගෙවන රු. 1000.00 බැගින් වූ ගාස්තුවක් රෝහලේ සරප් වෙත ගෙවා ලබාගත් පොදු 172 රිසිට් පත හා ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් රෝහලේ ගණකාධිකාරි වෙත ඉදිරිපත් කිරීමෙන් 2021-02-08 දින සිට 2021-03-01 දින දක්වා සාමාන්‍ය රාජකාරි දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා මෙම රෝහලේ ප්‍රසම්පාදන අංශයෙන් ලංසු ලියවිලි ලබා ගත හැක.

03. ලංසු අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර **2021/2022 වර්ෂය සඳහා ආපනශාලා සේවය සැපයීම** සඳහා යනුවෙන් සඳහන් කර 2021-3-02 දින පෙ.ව. 10.30 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් "**සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, ශික්ෂණ රෝහල, රාගම**" යන ලිපිනයට එවීම හෝ එම ලිපිනයේම ප්‍රධාන ගණකාධිකාරීගේ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ හැකිය.

04. ලංසු ලියවිලි පිටපත් දෙකෙන් මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර දෙක තනි කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

05. ලංසු විවෘත කිරීම 2021-03-02 දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලබන අතර, එම අවස්ථාවට ඉල්ලුම්කරුට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක.

06. තම අනන්‍යතාවය සනාථ කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ පසුව එක් පුද්ගලයකුට ලබාගත හැක්කේ එක් ලංසු ලියවිල්ලක් පමණි.

07. මේ සඳහා වැඩි විස්තර දුරකථන අංක 0112-951239 ට ඇමතීමෙන් ප්‍රධාන ගණකාධිකාරී වෙතින් ලබාගත හැක.

**සභාපති,**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,**
**උතුරු කොළඹ ශික්ෂණ රෝහල, රාගම.**